**ශීර්ෂය 234 - ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 234 - ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 29 දින දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 156.50 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 135.90 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 20.60 ක් හෙවත් සියයට 13.16 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 145.50 | 130.09 | 15.41 | 10.59 |
| මූලධන | 11.00 | 5.81 | 5.19 | 47.18 |
| **එකතුව** | **156.50** | **135.90** | **20.60** | **13.16** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 23401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 14.78 | 8.12 | 7.78 | 9.74 | 40.00 | 28.42 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ 2015 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.මිලියන 196.9 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) |
| (ආ) | ණය සහ අත්තිකාරම් ලේඛනය | 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය |

**3.2 පොදු තැන්පත් ගිණුම**

----------------------

වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.49,649,600 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------

විෂය අංක 23401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.199,439 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 01 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

----------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**3.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

-------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 28 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.5 කාර්යසාධනය**

-----------------

2015 දෙසැම්බර් 31 දිනට විසඳීමට තිබූ නඩු පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| **නඩු වර්ගය** | **2015 දෙසැම්බර් 31 දිනට විසඳීමට තිබූ නඩු සංඛ්‍යාව** |
|---|---|
| මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත්‍ර | 973 |
| විශේෂ අවසර ඉල්ලුම්පත්‍ර | 504 |
| අභියාචනා නඩු | 401 |
| වාණිජ මහාධිකරණ අභියාචන නඩු | 210 |
| මහාධිකරණ අවසර ඉල්ලුම්පත් | 162 |
| රීට් ඉල්ලුම්පත් | 05 |
| පළාත් බද මහාධිකරණ අභියාචනා නඩු | 1300 |
| ප්‍රතිශෝධන නඩු | 11 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපනය සම්බන්ධ නඩු | 01 |
| විවිධ නඩු | 09 |
| SC TAB APPEAL | 01 |
| SC SPECIAL | 12 |
| **එකතුව** | **3,589** |

**3.6** **මානව සම්පත් කළමනාකරණය**

2015 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 05 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 24 | 20 | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 148 | 116 | 32 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 119 | 125 | - | 06 |
| | **එකතුව** | **299** | **266** | **39** | **06** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ද්විතියික මට්ටමේ පුරප්පාඩු අතර සංවර්ධන නිලධාරී ( පර්යේෂණ ) තනතුරු 23 ක් ද විය. එම තනතුරු දෙපාර්තමේන්තුවෙහි කාර්යන් සඳහා අවශය නොවන බැවින් එය කාර්ය මණ්ඩල පුරප්පාඩුවක් ලෙස සැලැකිය නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුව සතුව වාහන 32 ක් පැවතියද දැනට සේවයේ නියුක්ත රියදුරන් 24 ක් බැවින් පුරප්පාඩු වී ඇති රියදුරන් 04 දෙනා බඳවා ගැනීමට කටයුතු නොකිරීම නිසා දෙපාර්තමේන්තුවේ වාහන ඌන උපයෝජන තත්ත්වයේ පැවැතුණි.